පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.20 පැය 1115 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out / 786 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## දළදා වහන්සේගේ බවට නිරූපණය වන ඡායාරූපයක් සමාජ මාධ්‍ය වල සංසරණය වීම සම්බන්ධව විමශර්නයක් ආරම්භ කිරීම - පොලිස් මූලස්ථානය

2025.04.18 වන දින සිට 2025.04.27 වන දින දක්වා මහනුවර ශ්‍රී දළදා මාලිගාවේදී පැවැත්වෙන "සිරි දළදා වන්දනාව" සඳහා පැමිණි පුද්ගලයෙකු විසින් ලබා ගන්නා ලද ඡායාරූපයක් බවට නිරූපණය වන ඡායාරූපයක් මේ දිනවල සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වෙමින් පවතී.

මෙම දළදා වන්දනාව සඳහා සහභාගි වන බැතිමතුන්හට තම ජංගම දුරකථන ක්‍රියාකාරී තත්ත්වයෙන් තබා ගැනීමට හෝ දළදා වහන්සේගේ ඡායාරූප ලබා ගැනීමට කිසිදු අවසරයක් ලබා දී නොමැත. මෙසේ තිබියදී මෙම සංසරණය වන ඡායාරූපය දළදා වන්නදනාව පැවැත්වෙන කාල සීමාවේදී ලබා ගන්නා ලද ඡායාරූයක්ද යන්න හා මෙය කවුරුන් විසින් ලබා ගන්නා ලද ඡායාරූපයක්ද යන්න නැතහොත් සංස්කරණය කරන ලද ඡායාරූපයක්ද යන්න අනාවරණය කර ගැනීම සඳහා වැඩබලන පොලිස්පති තුමාගේ උපදෙස් මත අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව විසින් විමශර්නයක් ආරම්භ කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**